සේරුවිල ප්‍රාදේශීය සභාව
-----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
---------------------------

1 මුල්‍ය ප්‍රකාශන
----------------

1.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 05 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 14 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මුල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂයේ දී සභාව විසින් මිලදී ගන්නා ලද රු. 630,000 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලර් 2 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ දෙසැම්බර් මස ගිවිසුම් අත්සන් කර ඇති ඉදිකිරීම් කොන්ත්‍රාත් 10 ක වැඩ ආරම්භ කර නොතිබිය දී ඇස්තමේන්තු වටිනාකම වන රු. 1,982,371 ක් වූ මුදල ණයහිමියන් ලෙස දක්වා තිබුණි.

(ඇ) ණයහිමියන්ට ගෙවන ලද රු. 350,438 ක මුදල ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කිරීම නිසා ණයහිමියන් සහ ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
----------------------------------------

රු. 608,336 ක් වූ කොන්ත්‍රාත් තුනක රැඳවුම් මුදල්වලට අදාල ගිවිසුම් , ගෙවීම් වවුචර් හා අනෙකුත් ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.3 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්.
------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති , රෙගුලාසි සහ විධිවිධානවලට අනුකූල නොවීම් විග්‍රහ කර පහත දැක්වේ.

| **නීතිරීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| 129 වගන්තිය | ගිණුම් අංක 233100110000050 දරන ජංගම ගිණුමේ රු. 284,533 ක ශේෂය සභා අරමුදලට බැර කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල රු. 196,420 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 2014 වර්ෂයට අදාල ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු. 186,550 ක් හා 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් රු. 556,490 ක රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොමැත. |
| 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (ඇ) | |
| (i) 59 වැනි රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේ දී සභාබල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදු කල යුතු වුවද, ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ii) 61 වැනි රීතිය | 2016 වර්ෂය සඳහා වෙළඳපල බලපත්‍ර ලේඛනයක් පිළියෙල කර පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (iii) 143 වැනි රීතිය | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, පුස්තකාල තැනපතු සහ අනෙකුත් තැන්පතු වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ගිණුම් ආරම්භ කළයුතු වුවද සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි. |
| (iv) 217 වන රීතිය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 10 ක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි. |

2. මුල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,645,655 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,642,265 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය රු.1,003,390 කින් වැඩි වී තිබුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු. 4,808,403 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලය රු. 1,003,390 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය
-------------------------------------

(අ) ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2016 වර්ෂය

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| බදු කුලී | 3,245 | 3,195 | 953 |
| බලපත්‍ර ගාස්තු | 656 | 720 | - |
| වෙනත් ආදායම් | 4,326 | 10,200 | - |

2.2.2 මුද්දර ගාස්තු
------------------

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හදුනා ගැනීමට සහ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාම
------------------------------------------------------------

ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිහිටි ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයෙන් වසරකට රෝගීන් 1200 කට පමණ ප්‍රතිකාර කර තිබුණත් මෙහි සේවය කල ආයුර්වේද වෛද්‍ය නිලධාරියා වෙනත් ස්ථානයකට මාරු වී යාමෙන් පසු වෛද්‍යවරයකු පත් කිරීමට සභාව විසින් කටයුතු නොකිරීම නිසා වෛද්‍ය මධ්‍යස්ථානය 2014 ජුනි මස සිට වසා තිබීමෙන් සභා බල ප්‍රදේශයේ ජනතාවට සේවය සපයා

ඔවුන්ගේ සෞඛ්‍ය මට්ටම නංවාලීමේ අරමුණු ඉටු කිරීමට නොහැකි වී තිබුණි. තවද, ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය වසා තිබීම හේතුවෙන් එහි ඇති රු. 61,665 ක් වටිනා බෙහෙත් ඖෂධ 51 ක් භාවිතයට ගත නොහැකි වී තිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

-----------------------------

(අ) ඉඩම් පවරා නොගෙන ඉදිකිරීම් කිරීම

-------------------------------------------

වනජීවී දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම්වල සභාව විසින් 2016 දෙසැම්බර් 31 වන විට රු. 85,862,048 ක ක්‍රීඩාංගන, පොදු ළිං, ප්‍රජා ශාලා, ජල ටැංකි, සුසානාගාර හා පොදු වෙළඳපලවල් ආදිය ඉදිකර තිබු නමුත් මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි.

(ආ) LED දැන්වීම් පුවරුව සකස් කිරීම

---------------------------------------

ප්‍රාදේශීය සභාව විසින් දැන්වීම ප්‍රචාරය සඳහා LED දැන්වීම් පුවරුවක් සවි කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු. 938,000 ක් 2014 මාර්තු 10 දින වියදම් කර තිබුණි. මෙම දැන්වීම් පුවරුව ක්‍රියාත්මක කිරීමේ දී යෙදිය යුතු ආලෝක ප්‍රමාණය හා ප්‍රචාරය කල හැකි දැන්වීම් ප්‍රමාණය පිළිබඳ සැළකිල්ලක් නොදක්වා කටයුතු කිරීමෙන් 2014 මාර්තු 17 දින සිට එය අක්‍රීය වී තිබීම නිසා මේ සඳහා වැය කල මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ගරාජය ඉදිකිරීම.

-----------------------------------

සභාව සතු වාහන ගාල් කිරීම සඳහා 2015 මැයි 18 දින සභා අරමුදලින් රු. 493,250 ක් වැය කර ගරාජයක් ඉදිකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගරාජය නිසි ලෙස නිම කර ඇති බවට වගකිව යුතු නිලධාරියා විසින් සහතික කර GI බට 44 ක් හා බට නැමීම සඳහා රු. 134,400 ක මුදලක් ගෙවා තිබුණි. නමුත් සත්‍ය වශයෙන් GI බට 35 පමණක් යොදා ගෙන තිබුණු අතර, බට නැවීමක් ද සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් රු. 35,150 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ගරාජය ඉදිකිරීමේ දී අඩු ඝනකමින් පොළොවට කොන්ක්‍රීට් යෙදීම නිසා එහි තැන් කිහිපයකින් කැඩී තිබුණි.

(ඈ) කඩ කාමර බදු දීම

---------------------

සභාවට අයත් කඩකාමර සහ තානායම සඳහා 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලැබිය යුතු කුලී ආදායම වන රු. 899,845 ක මුදල 2017 මැයි 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි.

(ඉ) අරමුණට පටහැනි වියදම්

----------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ කසල බැහැර කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2016 වර්ෂය සඳහා සේරුවිල ප්‍රාදේශීය සභාවට රු. 500,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. කෙසේ වුවද, සභාව විසින් අදාල අරමුණින් බැහැරව 2016 දෙසැම්බර් 29 දින රු. 89,600 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

(ඊ) ආදායම් බලපත්‍ර ලබා ගැනීම

-----------------------------------

සභාව විසින් 2017 වර්ෂයේ දී වාහන 08 ක් සඳහා නියමිත දිනට ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා රු. 9,050 ක දඩ මුදලක් ගෙවා තිබුණි. මෙය නිලධාරීන්ගේ නොසැළකිල්ල මත සභා අරමුදලට සිදු වූ පාඩුවක් ලෙස විගණනයේ දී නිරීක්ෂණය විය.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

3.3.1 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම - රු. 27,709,341

-------------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ගොඩනැගිල්ලෙහි ඉදිකර තිබූ වීදුරු ජනේල 105 සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ප්‍රකාරව Grill ආවරණය වෙනුවෙන් වර්ග මීටර් 140 කට රු. 630,000 ක් වෙන්කර තිබුණද, එම ආවරණ යොදා නොතිබූ අතර, එය සභාවේ ආරක්ෂාවට ගැටළුවක් විය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) වැසිකිළි පද්ධතියේ ජලනල මගින් ජලය කාන්දු වීම නිසා ජලය උතුරා යාමෙන් සහා ගොඩනැගිල්ල තුල සකස් කරන ලද වැසිකිළි දෙකම භාවිතයට නොහැකි වී තිබුණි.

(ඇ) 2005 අංක 05 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 30,065,945 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ධ (CIGFL) වන රු. 75,165 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මෙම ගොඩනැගිල්ලෙහි වහලය නියමිත පරිදි සෙවිලි කර නොතිබීම හේතුවෙන් උඩු මහලෙහි ජලය රැස් වී එහි ජනේල හා සිවිලින් හරහා පහත මහලෙහි විවෘතව පවතින කොටසට වැසි දිනයන්හිදී ජලය ගලා ඒම නිසා ගොඩනැගිල්ල තුල කටයුතු කර ගෙන යාමට අපහසු වී තිබුණි.

(ඉ) ඉහත අඩුපාඩු පැවතියද, අදාල කොන්ත්‍රාත්කරු මගින් ඒවා සකස් කර ගැනීමකින් තොරව 2016 අගෝස්තු 04 වන දින වවුචර් අංක 232 යටතේ රඳවා ගැනීම් මුදල් වන රු. 1,385,467 ක මුදල ලේකම්වරයා විසින් සහතික කර ගෙවා තිබිණි.

3.3.2 සේරුනුවර ආදාහනාගාරය

------------------------------

ආදාහනාගාරයක අවශ්‍යතාවය පිළිබඳ නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව ප්‍රාදේශීය සභාව විසින් පුරනැගුම ව්‍යාපෘතිය (**NELSIP)** යටතේ රු. මිලියන 16 ක වියදමකින් 2014 වර්ෂයේ ආදාහනාගාරයක් ඉදිකර තිබුණු අතර, 2017 මැයි 31 දින වන විට මල සිරුරු 5ක් පමණක් පුළුස්සා තිබුණි. මේ අනුව මේ සඳහා වැය කර තිබූ මුදල ප්‍රතිඵල රහිත වියදමක් වී තිබුණි.

3.3.3 පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ලිංගපුරම් පුස්තකාලය ඉදිකිරීම - රු.5,613,650

-------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම ගොඩනැගිල්ලෙහි ඇතුලත පොළවට සිමෙන්ති යොදා සකස් කර තිබුණද නිසි ප්‍රමිතියකින් තොරව සිදු කිරීම හේතුවෙන් එහි පොළවෙහි සිමෙන්තිය ස්ථාන කිහිපයක් පුපුරා ගොස් තිබුණි. එබැවින් මෙය දිගු කාලයක් භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) කොන්ත්‍රාත්තුවෙහි වැඩ නිම කොට 2016 නොවැම්බර් 14 දින වන විට සභාව වෙත භාරදිය යුතු වුවද, වැඩ නිම කිරීමේ සහතිකය ලබා දී තිබුණේ 2017 මාර්තු 15 දින වේ. ඒ අනුව ප්‍රමාද වූ මාස 04 සඳහා ප්‍රමාද ගාස්තු මුදල් වන රු. 336,819 ක මුදල අඩුකර නොතිබුණි.

(ඇ) පුස්තකාලය සඳහා White Board සවි කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු. 35,000 ක් ගෙවා තිබුණු නමුත් එය සවිකර නොතිබුණි.

(ඈ) පුස්තකාල භූමිය තුල පැළ 40 ක් සිටුවා මාස 06 ක කාලයක් නඩත්තු කිරීම වෙනුවෙන් රු. 160,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, එම පැළ නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා ඉන් පැළ 06 ක් විනාශ වී තිබීමෙන් ඒ වෙනුවෙන් ගෙවා තිබූ රු. 24,000 ක මුදල නිශ්ඵල වී තිබිණි.

3.3.4 සේරුනුවර සතිපොල පොදු වැසිකිලිය ඉදිකිරීම

(අ) ප්‍රාදේශීය සභාව විසින් යටිතල පහසුකම් සංවර්ධනය කිරිමේ වැඩසටහන යටතේ සතිපොල තුල පොදු වැසිකිලියක් ඉදිකර තිබූ අතර මෙහි වැඩ අවසන් කල බවට වැඩ අවසන් කිරීමේ සහතිකයක් 2016 දෙසැම්බර් 28 දින නිකුත් කර තිබුණද, බිල්පතෙහි සඳහන් වටිනාකම රු. 25,406 ක කාර්යයන් 2017 මැයි 31 දින වන විටද ඉටුකොට නොතිබුණි.

(ආ) වැඩ විෂය අංක 14 යටතේ 1:3 සිමෙන්ති මිශ්‍රණ අනුපාතයට 20mm ඝණකම ඇතිව කපරාරු කර රතු සිමෙන්ති යොදා බිම නිම කල යුතු වුවත්, එහි කපරාරුව පමණක් ඉටු කර තිබුණි. එමෙන්ම මෙහි අභ්‍යන්තර හා බාහිර බිත්ති මත දෙවරක් තීන්ත ආලේප කළ යුතු වුවද, එක් වරක් පමණක් තීන්ත ආලේප කර තිබුණි. ඉහත කාර්යයන් සම්පූර්ණයෙන් ඉටුකල බවට තාක්ෂණික නිලධාරියා විසින් සහතික කොට රු. 37,613 ක මුදලක් ගෙවීම සඳහා ඉදිරිපත් කර තිබුණි.

3.3.5 බොරළු යොදා මාර්ග අළුත්වැඩියා කිරීම හා ඉදිකිරීම

2015 දෙසැම්බර් 30 දිනැති මුදල් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/01 හි 1.2 මාර්ගෝපදේශයට පටහැනිව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ 2016 වර්ෂයේ දී මාර්ග 03 ක් බොරළු යොදා සකස් කර තිබූ අතර, මේ වෙනුවෙන් රු. 743,820 ක මුදලක් වැය කොට තිබුණි.

3.3.6 ආරම්භ නොකල කොන්ත්‍රාත්

සභා අරමුදල් යටතේ ඉදිකිරීම් කිරීම සඳහා ඇස්තමේන්තු වටිනාකම රු. 1,982,371 ක කොන්ත්‍රාත් ගිවිසුම් 10 ක් 2014 වර්ෂයේ දෙසැම්බර් මස අත්සන් කර ඇතත්, අදාල කොන්ත්‍රාත්වල වැඩ 2017 මැයි 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

3.4 ඌණ උපයෝජිත වත්කම්

ප්‍රාදේශීය සභාව සතු රු. 675,000 ක් වටිනා ඩබල් කැබ් රථය ඉදිරිපස බාර් එක සහ ටයර් මාරු කල යුතු නිසා වසර දෙක හමාරක කාලයක සිටද රු. 1,000,000 ක් වටිනා මහේන්ද්‍රා කැබ් රථය ඩීසල් පොම්පයෙහි ගැටළුවක් නිසා වසර හතරක කාලයක සිටද භාවිතයට නොගෙන ඉවත් කර තිබුණි.

3.5 පරිසර බලපත්‍ර නිකුත් කිරීම

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 12 කට අදාලව එම බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

3.6 සණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සේරුනුවර ප්‍රාදේශීය සභාවේ කසල කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

(අ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය ඉඩමක් ලබාදෙන මෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2013 වර්ෂයේ කරන ලද ඉල්ලීම මත වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙක්ටයාර 0.4 ක ඉඩමක් සේරුවිල බිට්ටුව ප්‍රදේශයෙන් ලබා දී තිබියදී සභාව විසින් එකතු කරනු ලබන කසල එම ඉඩමට බැහැර නොකර අවිධිමත් ලෙස වනජීවී දෙපාර්තමේන්තුවට අයත් ඉඩමකට බැහැර කර තිබුණි.

(ආ) මාසිකව කසල ටොන් 30 ක් පමණ බැහැර කරනු ලබන අතර, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට අනුව කසල වෙන් වෙන් වශයෙන් බැහැර කිරීමක් සිදු කර නොතිබුණි.මේ හේතුවෙන් එම ප්‍රදේශයේ ගැවසෙන වන අලින් කසල ආහාරයට ගැනීමට පුරුදු වී ඇති බැවින්, මෙය වන අලින්ගේ පැවැත්මට තර්ජනයක් වී තිබුණි. කෙසේ වුවද, වනජීවී දෙපාර්තමේන්තුව විසින් වෙන්කරන ලද භූමිය වටා විදුලි වැටක් සවිකර විධිමත්ව කසල බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ප්‍රාදේශීය සභාව විසින් 2017 මැයි 30 දින වන විටද ගෙන නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජුනි මස සිට පුරප්පාඩුව පවතින ආයුර්වේද වෛද්‍ය තනතුර සඳහා සුදුසු පුද්ගලයකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුස්තකාලයාධිපති, විදුලි කාර්මික නිලධාරී, සංවර්ධන නිලධාරී හා ආදායම් පරීක්ෂක යන තනතුරුවල වර්ෂ 04 ට වැඩි කාලයක සිට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගිණුම් තැබීම, උපයෝගී ලෙජර පවත්වාගෙන යාම |
| (ආ) | ආදායම් පාලනය | හිඟ ආදායම් අය කිරීම, ආදායම් ලේඛන පවත්වාගෙන යාම |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් බදු මුදල් ගෙවීම , ගිවිසුමට අනුව කාර්යයන් ඉටුකරවා ගැනීම |
| (ඉ) | මානව සම්පත් කලමනාකරණය | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම |